# 'පට්ඨාන' පහළොස්වන දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සියලුම සත්වයන් කෙරෙහි පතලා වූ මෛත්‍රී සහගත කරුණාවෙන් පිරිච්ච සන්තානයක් ඇති ඒ නිසාම චිර කාලයක් දස පාරමී ධර්‍මයන් සම්පාදනය කොට ගත්තාවූ සර්වඥතාඥානයෙන් දැක වදාළ ධර්‍මය කරුණාවෙන් කල්‍යාණ මිත්‍ර පෘතක්ජන හිත් වලට දේශනා මාර්ගයෙන් ආරෝපණය කොට ඒ පෘත්කජන සත්ව සන්තාන වලට ධර්‍මය අවබෝධ කර ගන්ට මහ සැලසුවා වූ ධර්‍මය වැක්කෙරුවාවූ සත්වයන්ගේ කෙලෙස් ගිනි නිවමින් සත්වයන්ගේ විමුක්තිය දකිමින් සත්වයන් සසර දුකින් මුදා හරිමින් සතුටු උනාවූ සත්වයන්ට මෛත්‍රීයෙන් මාර්ගය දැක්වූවා වූ ගාම්භීර දේශනා ඥානයකින් සමන්නාගත වූ අනන්ත ගුණ ඇති සම්මා සම්බුදුරජාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදුරජාණන්වහන්සේ විසින් දේශිත පිරිසිදු වූ සන්තාන නිවාලන්නාවූ ප්‍රමාණයක් නැති අනන්ත ගුණ සාගරයක් වූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්ම ස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්‍ම මාර්ගයේ ගමන් කොට ලොව්තුරාබුදුරජාණන් වහන්සේගේ ශිෂ්‍ය භාවයට පත් උනාවූ කෙලෙස් ගිනි නිවාගනිමින් සන්තාන සිහිල් කර ගනිමින් නිවන් ගමනේ යෙදුනාවූ ලෝකයාට වන්දනා කිරීමට පූජා පැවැත්වීමට පුණ්‍යක්ෂේත්‍රයක් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

අනන්ත වූ අපරිමාණ ගුණ ඇති බුද්ධ රත්නය ධම්ම රත්නය සංඝ රත්නයේ ඒ උතුම් ආනුභාව බලයෙන් ගුණ බලයෙන් වන්දනා කිරීම් වශයෙන් උපදවා ගත්තාවූ තුනුරුවන් වැඳීමේදී පහළ කරගත්තාවූ කුසල චේතනාවන්ගේ ඒ උතුම් ධර්‍ම ශක්තිය කුසල ශක්තියේ ආනුභාව බලයෙන් පුණ්‍ය ශක්තියේ ආනුභාව බලයෙන් මේ පිංවත් සැම දෙනාමත් මේ මොහොත වෙනකොට බණ ඇසීමෙන් දන් දීමෙන් සිල් රැකීමෙන් භාවනා කිරීම් ආදී වශයෙන් උපදවා ගත්තාවූ සියලුම පුණ්‍ය ධර්‍මයන්ගේ කුසල ධර්‍මයන්ගේ ආනුභාව බලයෙන් අදත් අපි මේ වෙලාවේදී දේශනා වශයෙන් සාකච්ඡා වශයෙන් ඉදිරිපත් කර කියා දෙන්නාවූ ගාම්භීර වූ ධර්‍ම කොට්ඨාසය හැම දෙනාටම ඉතාමත්ම හොඳින් වැටහේවා! තේරුම් ගන්ට ලැබේවා! ඒ සඳහා නුවණ පහළ වේවා! ඒ ධර්‍ම අවබෝධ කරගන්නාවූ නුවණට - ප්‍රඥාවට පරිෂ්කාර ධර්‍ම වශයෙන් සමාධිය සතිය ශ්‍රද්ධාව කුසල වීර්ය මතුවේවා! එක එක වචනයක් පාසා හොඳින් තේරුම් අරගෙන ඒ වචන වලින් කියා දෙන්නාවූ ධර්‍ම කාණ්ඩය හොඳින් හිතට දරාගෙන සැමදෙනාටම එය මනසිකාරයෙන් පාදක කරගෙන ලොව්තුරා බුදුරජාණන්වහන්සේ අවබෝධ කරගත්තාවූ දේශනා කළාවූ පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව

අවබෝධ කරගන්ට ලැබේවා! නිවන් පිණිස යන නිවන් මාර්ගයක් ධර්ම ප්‍රතිපදාවක්ම වේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

ඉතින් අද මේ වෙලාවේ අපි ඉදිරිපත් කර ගන්නේ ප්‍රත්‍යය ධර්ම විග්‍රහයේ තවත් අවස්ථාවක්. ප්‍රත්‍යය ධර්ම 24 ක් තිබෙන බව අපි මතක් කළා. අද අපි මීට කලින් කියපු ප්‍රත්‍යයක් පිළිබඳව නැවත වතාවක් හැරී සිහිපත් කර ගනිමු. ධර්මය ගාම්භීර නිසා නැවත නැවත හිතීම - නැවත නැවත එක කාරණයක් මෙනෙහි කිරීම භාවනාවක් වෙනවා වගේම ආසේවන ප්‍රත්‍යය ගුණයෙහි පිහිටනවා. හොඳට අවබෝධ වෙනවා. තව ගැඹුරින් ඒ ධර්මය හිතන්ටත් තේරුම් ගන්ටත් හැකියාව අවස්ථාව ලැබෙනවා.

පට්ඨාන ධර්ම දේශනා මාලාව හැටියට කථාකරගෙන යනකොට මේ අපිට අද අදාළව තිබෙන්නාවූ කාරණයක්. මීට පෙර අපි කථාකළා ප්‍රත්‍යය ධර්ම - සහජාත භාවය - අඤ්ඤමඤ්ඤ භාවය. ආරම්භ කළේ හේතු ප්‍රත්‍යයෙන්.  අද අපි කථාකරමු - මේ ධර්ම වල තිබෙනවා අමුතු ගුණ ස්වභාවයක්. අමුතුම ගුණ ස්වාභවයක් තිබෙනවා. අපි දැන් මේ ලෝකය වශයෙන් පවතින්නාවූ ධර්ම - ලෝකය වශයෙන් කථාකරන - ලෝකය  වශයෙන් හසුරුවන - ලෝකය වශයෙන් පවත්වාගෙන යන ධර්ම - ලෝකයා කථා කරන විදියට අමතන්නේ නැතුව - සලකන්නේ නැතුව - ඒවා මූල ධර්ම හැටියට පුන්චියට හිතාගෙන - පුන්චියට කොටස් කරගෙන එතනින් තමයි මේ වැඩ පිළිවෙළ ගෙනියන්නේ. ඒක අපි හොඳට හිතේ දරා ගත යුතුයි. දැන් අපි මේ කථා කරන පට්ඨාන ධර්ම විග්‍රහයන් තුල ජේතවනාරාම එහෙම කථා කෙරෙන්නේ නෑ. වේළුවනාරාම කථා කෙරෙන්නේ නෑ. ධර්ම වශයෙන් - උපමා වශයෙන් නම් මම යම් යම් දේවල් කියනවා. හැබැයි ධර්ම කාරණා හැටියට ජේතවනාරාමය - වේළුවනාරාමය - කඳු - ගස් - ඒවා නෑ. ඊළඟට සිටුවරු - දෙව්වරු - රජවරු - එච්චත් නෑ. ඒවා කථා කරන්නේ ලෝකයේ මට්ටමට යනකොට. ලෝකයා ව්‍යවහාර කරන හැටියට යනකොට  තමයි ඕව කථාකරන්නේ. එහෙම ලෝක ආමන්ත්‍රණයෙන් අයින් වෙලා - ලෝකයා හසුරුවන වාග් මාලාවෙන් - චිත්ත පින්තූර වලින් අයින් වෙලා - සංකල්පනාවෙන් අයින්වෙලා අපි මේ ඒ සියල්ලක්ම අන්තිම පුංචි - ධර්ම ගුණ හැටියට එක ධර්ම කොට්ඨාසයක් සකස් කර ගත්ත. ඒ කොට්ඨාසය තමයි අපි ධර්ම 170 ක් හැටියට මධ්‍යම ප්‍රමාණයෙන් සලකාගන්නේ.

නැවත වතාවක් අපි ඒ ගැන කිව්වොත්, මේ කථා කරන ධර්ම කාරණා ටිකට සිත් 89 අයිතිවෙනවා. චෛතසික ධර්ම 52 ක් එකතු වෙනවා. රූප ධර්ම 28ක් වෙනවා. නිර්වාණ ධාතුව යොදාගන්නවා. ඔය තමයි ධර්ම මණ්ඩලය 170 වෙ. මේ ධර්ම 170 ඇවිල්ල නිකං කඳු වගේ - ගස් වගේ - ගල්පර්වත වගේ මහ ඉස්සිලා පිම්බිලා ලොකුවට පේන ඒවා නෙමෙයි. පුළුන් කැල්ලක් ගත්තහම පුළුන් කැල්ලෙත් තියෙනවා පෙන්නන්න පුළුවන් දෙයක් පුළුන් ගුලිය කියල - ඒවගේම පොඩි පොඩි කෙඳි කෙඳි වශයෙන් හරි, යමක් කියන්න - පෙන්නන්න දෙයක් පුන්චියට හරි තියෙනවා. එතනිනුත් පල්ලෙහට ගිහිල්ලා බොහොම පුංචි ප්‍රාථමික ගුණ ස්වභාවයකින් යුක්ත දෙයක් තමයි මේ ධර්ම. ඔන්න ඕව තමයි කථා කරන්නේ. මේවගේ හැඩ වැඩ හරී වෙනස්. මේ 170 වම 170 ආකාරයි. නිවන වෙන ආකාරයක්. සිත් කියන ඒවා වෙන ආකාරයක්. චෛතසික කියන ඒවා වෙන ආකාරයක්. ඔය ධර්ම 170 වටම තිබෙන්නෙ අමුතු අමුතු ගුණ විශේෂ - අමුතුම අමුතු ගුණ විශේෂ - අමුතු ලක්ෂණ. ඒක නිසා එක

ධර්මයක්වත් සමාන වෙන්නේ නෑ. එකම ලක්ෂණයක් තිබෙන මොනවා හරි ධර්මතා දෙකක් නෑ. මේවගේ තිබෙනවා - ඔය ධර්ම 170 වේ තියෙනවා උපදින ධර්ම සහ නූපදින ධර්ම - එනම් හට ගන්න ධර්ම සහ හට නොගන්නා ධර්ම කියල තියෙනවා. නිර්වාණය උපදින ධර්මයක් නෙමෙයි. හට ගන්න ධර්මයක් නෙමෙයි. අනිත් ධර්ම ටික උපදිනවා - හට ගන්නවා - ඇතිවෙනවා - මතුවෙනවා - ඉලිප්පෙනවා. එතකොට නිර්වාණ ධර්මය අයින් කරහම අනිත් ඒව ඇතිවෙන ධර්ම. ඇතිවීම හටගැනීම - මතුවීම - ඉලිප්පීම යම් කිසි දෙයක ඇත්නම් ඒකෙ කඩා වැටීම - නැති වීම - විනාස වීම තියෙනවා - ඒකත් ඒකෙම තව පැත්තක්. ඒ නිසා මේ එකට හට ගන්න ධර්ම වල තිබෙනවා හැමවෙලාවෙම මොහොකට හරි හේත්තුවක් දාගෙන තමයි ඕව පහළ වෙන්නේ. එහෙම ගතියක් ඕවගේ තියෙනවා.

ඔය ධර්ම හැටියට බැලුවම ඇත්ත වශයෙන්ම මේ ලෝකයේ තිබෙන්නාවූ ස්වභාවය සැලකුවහම අපි ඉතින් 'මේ ධර්මය ලොකුයි - මේක බලවත්' ඔහොම කියනවා. එක අංශයකින් එහෙම උනාට හැබැයි තවත් අංශයකින් දූර්වලයි. දැන් බලන්නකෝ තණ්හාව ගැන කියනවනේ. මේ තණ්හාව ගැන කියනවා - තණ්හාව හරිම බලවත් - සංසාරයේ දිගට ගෙනියනවා - දෘෂ්ටිය බලවත් - සංසාරයේ මුලා කරනවා - වරදවා ගන්නවා - ඔහොම කියල තියෙනවනෙ. හැබැයි ඒ ධර්මයේ ප්‍රතිචාර දැක්වීම් වශයෙන් එහෙම තිබුනට ඒකෙ උප්පත්තිය වශයෙන් බැලුවට පස්සේ හරි දූර්වලයිනේ. හරිම දූර්වලයි. තණ්හාව කියනඑක දූර්වලයි. දෘෂ්ටිය කියන එක - මාන්නය කියන එක හරි දූර්වලයි. අපි කියන්නේ 'මහා පණ නැති' කියල අන්න එහෙම එකක් තියෙනවා එකවිදියකට. තණ්හාව කියන එක මහා බලවත් කියල කියන්නේ තවත් විදියකටයි. දෘෂ්ටිය කියන එක මහා බලවත් කියන්නේ - හයිය තියෙන එකක් කියල කියන්නේ එක විදියකටයි. මාන්නයත් බලවත් කියල කියන්නේ එක විදියකටයි. හැබැයි මේ අය කොච්චර බලවත් උනත් මේ අය කොහේ හරි හේත්තුවක් ගහගෙන තමයි උපදින්නේ. ඔය ඉන්නවනේ මහා ලොකු බලවත් - බල කණු. ඊළගට මෙයා මහ ප්‍රබලයි අරෙහෙ මෙහෙ කියකියා ඔය මිනිස්සු ඉන්නවනේ - හරි චණ්ඩියා - හරි බලවතා - ඔය ඔක්කොම චණ්ඩි කම් - බලවත් කම් - ශක්තිමත් කම් තනියෙන් බෑ. කාගෙ හරි හේත්තුවක් ගහගෙන ඒ හෙත්තුවේ පිහිටෙන් තමයි - තවත් කෙනෙකුගේ පිහිටෙන් තමයි ඔය කියන මිනිස්සු මහා චණ්ඩි - මහා බලවත් කියල කියන්නේ. අපි කියන්නේ සාමාන්‍යයෙන් කෙරුම්කාරයෝ කියල. ඔය ඔක්කෝම කෙරුම්කාරයෝ කාගේ හරි හේත්තුවක් හින්ද තමයි කෙරුම්කාරයෝ වෙලා ඉන්නේ. තණ්හාවත් ඔය වගේ. මාන්නයත් ඔය වගේ. ඒක නිසා ඔය ධර්ම වලට හැම වෙලාවේම තනියෙන් උපදින්න බෑ. තනියෙන් හටගන්ට - තනියෙන් උපදින්ට - කාගෙවත් උදව්වක් උපකාරයක් නැතුව - ස්වකීයව - නිකං පහළවෙලා එහෙම වෙන්ට ඕනෑ කියල ගතියක් ඔය ධර්ම වලට නෑ.

දැන් තේරෙනවනේ බැලුවයින් පස්සේ ඒවාට තනියෙන් ඉන්න නොහැකියාව හින්ද දූර්වලයි කියල. දැන් යම්කිසි ධර්මයක් හොඳටම බලවත් නම් ඒක එන්නෙ තනියෙන්. ඒක එන්න ඕනේ නිකං ජගතෙක් වගේ වීරයෙක් වගේ හොඳ බලවත්ව තනියෙන් එන්න තියෙන්න ඕන. හැම එක්කෙනාම ඔය සංසාරයේ ඉන්න මිනිස්සුන්ට සත්වයන්ට අපි පාට් එක දානවා කියල කියන්නේ - චණ්ඩි කම් පෙන්නනේ පොදි බැඳගෙන පිරිවරාගෙන ඇවිල්ල.

ඒක නිසා යම් කිසි තැනක - යම්කිසි දෙයකට හේත්තුවක් දාල - ඒක ආධාර කරගෙන - ඒක භූමිය කරගෙන - ඒක වස්තුව කරගෙන තමයි මේ හැම ධර්මයක්ම තියෙන්නේ. ඕක නිසා ඕකට  කියනවා මෙන්න මෙහෙම වචනයක්. ඒ කියන්නේ ධර්ම තියෙනවා තවත් එහෙකට නිකං  ආරක්‍ෂක හැටියට - භූමියක් හැටියට - ක්ෂේත්‍රයක් හැටියට උදව් වෙන්න පුළුවන්  ගති තියෙනවා.  දැන් බලන්ට මිනිස්සු ගෙවල්වල ඉන්නවනේ. ගෙවල්වල ළමයි හැම එක්කෙනාම දෙමව්පියෝ ආධාර කරගෙන තමයි ඉන්නේ, හැම වෙලාවේම කොහේ ගියත්. ගෙදර දැන් බලන්ට මේ ගෙවල් වල හදනවනේ බල්ලෝ බළල්ලු. ඔය බල්ලෝ බුරනවා. බුරනවා, හපන්න යනවා අනිත් අයව ඉතින් මහා චණ්ඩි. හරියට රෑටයි දවාලටයි ගෙදරට එන්න දෙන්නේ නෑ බුරනවා. මෙයාට හරි හයියක් තියෙනවනේ. ඒ බල්ලට මිනිස්සු බය කරන්ට පුළුවන් ගතියක් තියෙනවා. හැබැයි ඒ හයිය ගතිය රඳා පවතින්නේ ඒ ගෙදර ඒ ඉඩමේ විතරයි. බලන්නකෝ ඒකේ තියෙන අමුතු ගතිය. එයා ඒ ඉඩම පන්නල අයින්කරලා දුරට ගියාද අරටික නැනේ. එතකොට ඒ බල්ලට, යම්කිසි විදියකට  බුරන්ට මහා ක්ෂේස්ත්‍රයක් - හේතුවන දෙයක් තිබෙනවා. තවත් එකක් තමයි ඒ ගෙදර ඉන්න අයිති කාරය - කවුරුහරි හිටියොත් එහෙම එයා හරි සැරයි. අනිත් අය ගාව නෑ. ආන්න බලන්න ඒක නිසා ඒකට කියනවා ‘හේතු වන ගතිය’ ‘එයාගේ හයියට භූමියක් වෙන ගතිය’ කියල.

තව එකක් තියෙනවා ඔය දහම් පොතපතේ උදාහරණයක් දාල තියෙනවා ලස්සන. ප්‍රත්‍යය කථාව කියන්න ඉස්සෙල්ල මම මේ කියන කථාව හොඳට අහගෙන ඉන්න මොකක්ද මේ කියන්න යන්නේ කියල. අපි මීට ඉස්සෙල්ලත් මේක කිව්වා. ඔය ප්‍රදර්ශන තියෙනවනේ. විශේෂයෙන්ම චිත්‍ර ප්‍රදර්ශන - චිත්‍ර ප්‍රදර්ශන වල තියෙන්නේ චිත්‍රනෙ. ඔය කොළවල කැන්වස් වල චිත්‍ර ඇඳල තියෙනවා - ගිහිල්ලා ඉතින්  ඒවා බල බලා ඉන්නවා. දැන්මේ චිත්‍රය කියන එක කොහෙද තිබුනේ? බිත්තියේද කඩදාසියේද? මේක තියෙන්නේ කඩදාසියේ. දැන් මේ චිත්‍ර බලන්ට යන අය බලන්න හැරෙන්නේ කොළේ පැත්තට - හැරෙන්නේ කැන්වස් එක පැත්තට. හැබැයි බලන්නේ කොළේ නෙමෙයි. බලන්නේ කොළේ තිබෙන්නා වූ වෙනත් දෙයක්. ඒ කොළේ තියෙනවා  පින්තූරයක්. ඒ පින්තූරය තිබෙන්නේ කොළේ. ආන්න ඒ කොළේ පැත්තට හැරුනත් බලන්නේ කොළේ නෙමෙයි. ඒකෙ තිබෙන්නාවූ යම් කිසි දෙයක්.  ඒවගේ මේ දැන් බලන්ට - මේ පින්තූරය කියන එකට තනියෙන් ඉන්න බෑනේ. අර මිනුස්සු ඇවිල්ල පින්තූරය හැටියට බලනවනේ. ඒ බලන කොට පින්තූරයක් හැටියට තනියම නියෝජනය  වෙන්න බෑ. පින්තූරය බලන්ට මිනිස්සු ආවට පින්තූරය කියන එක අසරණයි. හැමවෙලාවෙම අනිත් එක්කෙනාට හේත්තුවෙලා ඉන්නේ. ඒ තමයි අර කඩදාසියේ එහෙම නැත්නම් කැන්වස් එක එහෙම නැත්නම් ඒක ඇඳල තිබෙන board එක - ඒ borad එක නැතුව ඒ පින්තූරයට ඉන්න බෑ. එතකොට තියෙනවා board එකේ  පිහිට දරාගෙන - පිහිට කරගෙන - ක්ෂේත්‍රය කරගෙන - නිශ්‍රය කරගෙන - භූමිය කරගෙන තමයි පින්තූරේ තියෙන්නේ. ඒ board එක පිහිටයි. ආන්න එහෙම ධර්ම තිබෙනවා ඔය ‘නාමධර්ම වල’ සහ ‘රූපධර්ම වල’. ඒවාට තනියෙන් මතුවෙන්ට ඉලිප්පෙන්ට බෑ. දැන් බලන්නකෝ මේ ලෝකය එළිය කරනවානේ. දැන් අපි කියනවා ‘ලෝකය එළිය කරනවා’ – ‘ආලෝකමත්’ – ‘උදේ පාන්දරට එළිය වෙනවා’ කියල . රාත්‍රියට අපි කියනවා ‘පහන් දල්වනවා’ – ‘පහනක් පත්තු කරනවා’ – ‘ලාම්පු පත්තු කරනවා’ - කියල. එහෙම කියනවා. දැන් බලන්ට අපි පහනක් දැල්ලුවහම - දැන් මේ වෙලාව වෙනකොට සමහර රටවලට රාත්‍රියනෙ.  අපිට මේ වෙලාවට රාත්‍රිය. අපේ වෙලාව 10 ත් පහුවෙලා. දැන් මෙහෙ light දාල තියෙන්නේ. හැබැයි

මම light එක දිහා නෙමෙයි බලන් ඉන්නේ. මට මේ light එක දාල තියෙන්නේ හිසට උඩින් වහලේ සීලිමේ - හැබැයි ඒ bulb එක නිසා ආලෝකයක් මට තියෙනවා උදව්වට. හැබැයි මේ ආලෝකය තිබෙන්නේ අර bulb එක ආධාර කරගෙන. ආලෝකයටම තනියම බෑ. එතකොට තේරුනානේ ලෝකය එළිය කරන්නාවූ ආලෝකය අපි කිව්වට මහා බලවත්ය කියල එක අතකින් ඒක බලවත් නෑ. හැමවෙලාවෙම කොහේ හරි හේත්තුවක් දාලා ඉන්නේ. තනියෙන් ඉන්න බෑනේ. දැන් විදුලියට අර bulb එක නැත්නම් ඉන්න බෑ. අපි කියනවා ඔන්න එළිඋනා කියල. උදේ පාන්දරට එළි උනාට එළිය කියන එක අර සූර්යයා ආධාර කරගෙන තියෙන්නෙ. පහනක් දැල්ලුවම පහනේ දැල්ල නිසා තමයි ආලෝකය තියෙන්නේ. ලාම්පුවක් පත්තුකරහම ලාම්පුවේ දැල්ල නිසා තමයි ආලෝකය තියෙන්නේ. ඒවගේ හැම වෙලාවේම මොකක් හරි දෙයක හේත්තු වෙලා තමයි මේක තියෙන්නේ. ආන්න එහෙම කාගෙවත් පිහිටක් නැතුව ඉන්ට බැරි හින්ද එක එක දේවල්, අනිත් ධර්ම වලට උපකාරවන - භූමියක් වන - නිශ්‍රය වන - ගතියක් තියෙනවා. මේ ධර්මයේ එහෙම ශක්තියක් තියෙනවා - ඒකට කියනවා **'නිස්සයපච්චය'** කියල. **'නිස්සයපච්චය'** කියන්නේ භූමියක් හැටියට ඉදිරිපත්වෙලා අනිත් එහෙකට උදව් කරනවා. ඒක නිසා, තවත් එහෙකට වස්තුවක් - තවත් එහෙකට භූමියක් වන ශක්ති විශේෂයක් හැම එහෙකටම නෙමෙයි සමහර ඒවාට තියෙනවා. ඒක නිසා අපි අද ආන්න ඒ **'නිස්සයපච්චය'** කියන ගුණය - ඒ ශක්තිය - අපි පොඩ්ඩක් බලමු - ඒවා කොහෙටද තියෙන්නේ - කාටද තියෙන්න - කොතනද තියෙන්නේ - කොහොමද වෙන්නේ කියල. හැබැයි මුළු සම්භාරයම මේකේ කථා කරන්න බැරිවෙයි. හැබැයි අපි තරමක් - බොහෝම අල්පයක් - අංශු මාත්‍රයක් පමණක් මේකෙන් අද කථාකරමු. එතකොට ඉස්සරහට මේක තේරුම් ගන්ට පුළුවන් වෙයි. මීට ඉස්සෙල්ල යම් යම් අවස්ථාවලදී මම මේ ගැන මතක් කිරීම් කරල තියෙනවා.

දැන් **'නිස්සය'** කියල කියන්නේ මොකක්ද? භූමියක් - වස්තුවක් - ක්ෂේත්‍රයක්- ඒවාගේම යම්කිසි උපකාරක වස්තුවක් හැටියට තවත් එහෙකට උදව් වෙනවා. දැන්මේ තියෙනවානෙ - සිත් තියෙනවා - චෛතසික ධර්ම තියෙනවා - රූප තියෙනවා. ඕව හැමවෙලාවෙම හේත්තුවක් දාගෙන තමයි ඉන්නේ. දැන් අපි කියනවනේ මනුස්සයෝ හරිම ලස්සනයි - හරි හැඩයි කියල. ඒ හැඩයි කියන එක ලස්සනයි කියන එක, කොහේ හරි ගඳ ගහන - පිළිකුල් සහගත ශරීරයකට හේත්තුවෙලා තමයි ඔය කථාව තියෙන්නේ. ඒක නිසා ලස්සන කියන එක තනියෙන් එන්නේ නෑ. පාට කියන එක තනියෙන් එන්නේ නෑ. ඒවගේ මේ චිත්ත චෛතසික රූප කියන ධර්ම වල තියෙනවා තනියෙන් ඒගන්න බැරි අනිත් එක්කෙනාගේ උදව්වක් උපකාරයක් ලබා ගන්නාවූ සහ අනිත් එක්කෙනාගේ උදව්වක් උපකාරයක් කරන්න පුළුවන් ගතිය, භූමියක් හැටියට පුළුවන් ගතිය තියෙනවා.

අපි මේ ධර්ම කථා කරන කොට සමහර ඒවා සියුම් සමහර ඒවා ගොරෝසුයි. අපි ගොරෝසු එහෙකට යමු. ඒක තේරුම් ගන්න ලේසියි. ඊට පස්සේ සියුම් එහෙකට යමු. සියුම් ඒවා තමයි චිත්ත චෛතසික ධර්ම - හරිම සියුම්. ඒ චිත්ත චෛතසික ධර්ම වලත් සමහර චෛතසික තියෙනවා අතිශය සියුම්. ඒවා තියෙනවාදැයි කියල තේරුම් ගන්න බැරි තරමට සියුම්ම ගුණ ස්වභාවයන්. අපිට තේරුම් ගන්න පුළුවන් ටිකක් ඔය රූප. අපි ඉස්සෙල්ල ඔය රූප පැත්තට යමු බලන්න.

රූප 28 ක් තියෙනවානෙ. ඒ රූප 28 මේ කියන්නෙත් මේ පින්වතුන්ට අසාගෙන වටහා ගන්න ටිකක් පුළුවන් වෙන විදියට. දැන් මම ඉස්සෙල්ල උදව්වක් හැටියට කිව්වනේ උපමාවක්. ඒ තමයි පින්තූරයක්. පින්තූරය කියන එක board එක නෙමෙයි. ඒත් පින්තූරය කියන්නේ board එකේ තියෙන දෙයක්. board එකක් නැතුව - එහෙම නැත්නම් ඒක පිහිටා තියෙන්ට කැන්වස් එකක් නැතුව කොළයක් නැතුව පින්තූරයට ඉන්න බෑ. අපි ඉස්සර මුල් කාලේ ගියානේ පින්තූර බලන්ට. පින්තූර බලන්ට කියල ගිහිල්ලා - ඔය චිත්‍රපටි එහෙම බලන්නේ සුදු පාට තිරයක් දිහා බලාගෙන ඉන්නවා. හැබැයි තිරේ දිහා බැලුවේ නැත්තනම් ඇහැ හැරෙව්වේ නැත්නම් පින්තූර හම්බ වෙන්නේ නෑ. ඉතින් හැමවෙලේම අපිට අර කොහේදෝ තියෙන projector එහෙක තමයි ඒ film එක යන්නේ හැබැයි අපිට ඒක බලන්න බෑ අර තිරේ නැත්නම්. හැම වෙලාවේම තිරේ උඩට දාල තමයි අර දැඟලිලි ඔක්කොම ටික පෙන්නන්නේ - අධාරකයනේ. දැන් ඒවගේ ගත්තම රූප 28 වේ රූප තියෙනවා 4 ක් - ඒ රූප හතර තමයි පඨවි - ආපෝ - තේජෝ - වායෝ. මේවට කියනවා මහා භූත හතර කියල. මේ මහා භූත රූප 4 ආධාර කරගෙන තමයි අනිත් 24 ඉන්නේ. ඒ 24 ට කියනවා 'උපාදා රූප' එහෙම නැත්නම් 'උපාදාය රූප' කියල. ඒ උපාදාය රූප වලට ඉන්න බෑ අර මහාභූත 4 නැතුව. එතකොට එතනත් තියෙනවා 'නිස්සය' කියන 'භූමිය වෙන්නාවූ' ගතිය. ඊළඟට මේ රූප 4 ගත්තොත් එහෙම කවදාකවත්ම ඉන්ට බෑ - තනියෙන් ඉන්ට බැනේ. හැම වෙලාවෙම පඨවි ධාතුව අනිත් ධාතු තුනට හේත්තු වෙන්ට ඕනෑ. ඒ අයගේ උදව්ව ඕනෑ. ආපෝ ධාතුවට තනියෙන් ඉන්ට බෑ අනිත් තුන්දෙනාගේ උදව්ව ඕනෑ. වායෝ ධාතුවට තනියෙන් ඉන්ට බෑ අනිත් තුන්දෙනාගේ උදව් ඕනෑ. තේජෝ ධාතුවට තනියෙන් ඉන්ට බෑ අනිත් තුන්දෙනාගේ උදව් ඕනෑ. හැමවෙලාවෙම එක්කෙනෙක් අනිත් එක්කෙනාට උදව් කරනවා. ඔන්න ඔය වගේ ගතියක් මේකේ තියෙනවා - 'නිශ්‍රය භාවය' – 'භූමියක් - ආධාරකයක් වෙන ගතිය' . දැන් මේ තරමක 'නිශ්‍රය භූමිය' වෙන්නාවූ ගතිය කිව්වේ.

තවත් එකක් බැලුවොත් එහෙම අපිට මෙහෙම හිතන්ට පුළුවන් - භූමිය හැටියට තියෙන්න එපාය ගහක් හැදෙන්ට - අහසේ හැදෙන්නේ නෑනේ. ඉතින් ඒ වගේ මොකක් හරි දෙයක් හට ගන්ට 'භූමිය' හැටියට වස්තුවක් අවශ්‍යයි. දැන් මේ කියන්නාවූ නිශ්‍රය ධර්ම මේ විදියට වර්ග දෙකක් වෙනවා. හැබැයි හොඳට මතක තියාගන්න මේ බොහෝම බරපතල මාතෘකාවක්. මේ කථා කරන්ට යන්නේ ඕලාරික ධර්ම සියුම් ධර්ම. මේ 'නිශ්‍රය' එහෙම නැත්නම් අනිත් ධර්මයකට භූමියක් වෙන - උදව්වෙන - උපකාර වෙන ඒ ස්වභාවය විධි දෙහෙකට කථාකරනවා. ආකාර දෙහෙකට කියල දෙනවා. එකක් තමයි 'සහජාත නිශ්‍රය'. අනිත් එකට කියනවා 'පුරේජාත නිශ්‍රය' කියල. වචන දෙක මතක තියා ගන්න 'සහජාත නිශ්‍රය ප්‍රත්‍යය' සහ 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' කියල. මේක මේ අලුතින් අහන්නාවූ කෙනෙකුට තරමක ගැඹුරු ස්වභාවයක් දැනුනත් ඕක තේරුම් ගන්නකොට හරි රහක් තියෙනවා.

'සහජාත නිශ්‍රය ප්‍රත්‍යය' - කොහොමද ඕක තේරුම් ගන්නේ? බලන්ට - 'සහජාත' කියල අපි ඊට ඉස්සෙල්ල ප්‍රත්‍යයකුත් කථා කරා. 'එකට උපදින - එකට උපන්' = 'සහජාත'.

'සහජාත නිශ්‍රය' = 'එකට උපදිනවා - අනිත් එක්කෙනාට භූමියකුත් වෙනවා'. ආන්න ඒක එකක්. අනිත් එක්කෙනෙකුට භූමියක් ක්ෂේත්‍රයක් ඒවගේම පිහිටාධාර වෙන්නාවූ ගතියකුත් තියෙනවා. එකටත් උපදිනවා.

ඔය හිතක් පහළ වෙනකොට ඒ හිතේ තිබෙන්නාවූ - අපි කියනවනේ නාම ධර්ම කියල - නාම ධර්ම කියන්නේ චිත්ත චෛතසික ධර්මනෙ. ඕවා එකිනෙකට එකිනෙකට භූමි වශයෙන් උදව් උපකාර වෙන්නාවූ ගති ස්වභාවයක් ඕවගේ තියෙනවා. තව එක්ක තියෙනවා - දැන් ආකාර කියක් කිව්වද? දෙකයි. 'සහජාත නිශ්‍රය ශක්තිය' 'පුරේජාත නිශ්‍රය ශක්තිය' එහෙම නැත්නම් 'සහජාත නිශ්‍රය ප්‍රත්‍යය' 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'. සමහර ඒවා තියෙනවා එකට උපදිනවා - එකට උපදින ගමන් මොකක් හරි විශේෂිත ශක්තියකින් අනිත් එක්කෙනාට උදව් වෙනවා. ඒකට පෙර හිටපු ස්වාමීන්වහන්සේලා උපමාවක් කරලා තියෙනවා. හරිම ලස්සනයි ඒක. අපේ ඔය ගම්වල ඉන්න අම්මල - ආච්චි අම්මලට හොඳ දක්ෂ හැකියාවක් තිබුනා හරි දක්ෂකමක් තිබුනා. ඒ තමයි පන්කොළ වලින් හොඳට වියන්න පිළිවන්. බෑග් වියනවා - පැදුරු වියනවා - එක එක ජාති වියනවා. හැබැයි එහෙම වියාගෙන යනකොට ඒ ගොල්ලන්ගේ වැඩක් තියෙනවා - මේ ගොල්ලෝ එක එක පින්තූර දානවා - ඒකියන්නේ වියාගෙන යන කොට කුරුල්ලෝ මතුවෙනවා - වියාගෙන වියාගෙන යනවා - මල් මතුවෙනවා - ඒවාට කියනවා රටාවල් කියල. රටා වියනවා කියලත් කියනවනේ. දැන් අපි හිතමු පැදුරක් වියනවා - පැදුරක් වියල ඉවරවෙන කොට මෙන්න ඒකේ මොකක්ද ලස්සන රූපයක් තියෙනවා - අද කාලේ දකින්න පුළුවන් පිරිත් මණ්ඩප්පවල. ගොක්කොළ අරගෙන අපේ අය ලස්සනට වියමනක් කරනවා. වියමන කරලා ඉවරවෙන කොට මෙන්න ඒකේ ලස්සන කුරුල්ලෝ මතුවෙනවා - හංසයෝ මතුවෙනවා - තරු මතු වෙනවා - ඒවගේම නැට්ටුක් කාරයෝ මතුවෙනවා - දැන් බලන්ට මේ ගොක්කොළ වලින් වියන වියමන කරලා ඉවර උන ගමන්ද අර පින්තූරය වැටෙන්නේ නැත්නම් වියාගෙන යනකොටම පින්තූරයක් ඒ එක්කම හරි හරියට මතුවෙනවද? බැලුවයින් පස්සේ මේ දෙක එකටනේ වෙන්නේ. මේ ගොක්කොළ රටා කාරය එකට මේක වියනවා. එක එක හැඩ තල දාල වියන කොට ඒ ගොක් කොළෙන් වියමනත් සිද්ධ වෙනවා පින්තූරෙත් ඒ එක්කම මතුවෙනවා. ඒවගේම තමයි පැදුරු වියන්නාවූ අම්මල ඒ ගොල්ලන්ගේ වියමන කරගෙන යන කොට පැදුරත් වියවෙනවා ඒවගේම ලස්සන රූපත් ඒකෙ මතුවෙනවා. ඔය දෙක සිද්ධ වෙන්නේ එකටනේ. ඒක නිසා කියනවා 'එකට උපදිනවා' කියල - 'සහජාත ස්වභාවය'- පින්තූරයත් උපදිනවා - වියමනත් කෙරීගෙන යනවා. පින්තූරයයි වියමනයි දෙක එකට යනව. අන්න ඒකට කියනවා 'සහජාත සවභාවය' කියල. දැන් ඒ පින්තූරය කියන ලස්සන කලා art work එක තියෙන්නේ කොහෙද? පැදුරේ. පැදුරේ තියෙන්නේ. හැබැයි පැදුරේ තිබුනට ඒ පින්තූරේට - ඒ කලාවට - ඒ රටාවට ඉන්න පුළුවන් භූමිය තමයි පැදුර. දැන් රෙදි වියනකොටත් ඕකනේ. රෙදි වියනකොටත් එක එක පැත්තට නූල් දාල වියනවා - ඉවරවෙන කොට මෙන්න ලස්සන කලාවල් - මල් - මාල - දිග ඉරි - අරවමේවා ඔන්න මතුවෙනවා. එතකොට රෙදි විවීමයි - ඒකෙ යම්කිසි කලාවක් - යම්කිසි පින්තූරයක් මතුවීමයි දෙක එකට සිද්ධ වෙනවා. ඒක නිසා කියනවා පින්තූරයට ඉන්න උදව් වෙන උපකාර වෙන ඒ පැදුර - පිරිත් මණ්ඩප්පයේ ඒ වියමන - රෙදි - මේ ඔක්කෝම - රෙද්දත් වියවෙනවා - පැදුරත් වියවෙනවා - පින්තූරයත් හැදෙනවා. ආන්න ඒ වගේ එකට උපදින්නාවූ ගතියක් තියෙනවා. පින්තූරෙ, එකට උපදිමින් අනිත් එක්කෙනාට පිහිට වෙනවා.

චිත්ත චෛතසික ධර්මයන්ගේ තිබෙනවා ඔය වගේ වැඩ සටහනක්. අනිත් එක්කෙනාගේ උදව්වක් එක්ක තමයි උපදින්නේ හැබැයි සමහර ඒවගේ තිබෙනවා, අනිත් අයත් උදව්

කරගෙන තමන් උපදින ගමන් මෙන්න එයාට විශේෂ උදව්වකුත් විශේෂ උපකාරයකුත් භූමියකුත් වෙනවා. අන්න ඒකට කියනවා මොකක්ද 'සහජාත නිශ්‍රය ප්‍රත්‍යය' කියල. 'එකට උපදමින් තව කෙනෙකුට උදව් වීමේ - පදනමක් වීමේ - භූමියක් වීමේ ශක්තිය'. ඒක ඔහොම කියාගෙන කියාගෙන ගියොත් විතරයි 'අනේ මේවගේ අස්සේ මේවා තියෙනවානේද' කියල හිතන්වත් හිතෙන්නේ. නැත්නම් ඒක අපිට අහුවෙන්නේ නෑ. අපි හිතන්නෙත් නෑ - අපිට අහුවෙන්නෙත් නෑ - එහෙම ගුණයක් - එහෙම ගතියක් මේකේ තියෙනෙවා. එහෙම එකක් තියෙනවා.

දැන් අපි හිතමු මෙහෙම. අපි උපදිනවා. උපදින වෙලාවේ - ප්‍රතිසන්ධිය ගන්න වෙලාවේදී - එහා ලෝකයෙන් මැරී - නැතිවී - අයින් වී එන්නාවූ හිත, මෙහා ලෝකයේ තැනක මවු කුසක හට ගන්නවා. ඒ හට ගන්නේ ප්‍රතිසන්ධියනේ. ප්‍රතිසන්ධි සිත - ප්‍රතිසන්ධි විඤ්ඤාණය කියල අපි හිතට මුල් තැන දීල සිතට වැඩියෙන් තැනක් ආරෝපණය කරලා කථා කරාට ඔකේ අස්සේ තිබෙනවා - හිතට තනියෙන් ඉන්ට බෑ. ඒ හිතේ තිබෙනවා තව එයත් එක්ක - ප්‍රතිසන්ධි සිතත් එක්ක හට ගන්න - මතුවෙන - ඇතිවෙන තව චෛතසික ධර්‍ම ටිකක් තියෙනවා. අපි ඒක ඉතින් කථා කරන්නේ නැහැ වැඩි වැඩියෙන්. ඒ චෛතසික ධර්‍ම ටිකයි ඔය ප්‍රතිසන්ධි සිතයි දෙකම එකට කරලා අපි කියමු මෙහෙම 'ප්‍රතිසන්ධි නාම ධර්‍ම' කියල. නාම ධර්‍මනෙ සිත් කොහොමත්. ප්‍රතිසන්ධි අවස්ථාවේ නාම ධර්‍ම. දැන් චෛතසික ධර්‍මයන්ට ඉන්ට බෑ හිත නැත්නම්. හිතට ඉන්න බෑ - පහළ වෙන්න බෑ චෛතසික නැත්නම්. එතකොට දෙගොල්ලොම ඔවුන්ට මොකක් හරි භූමියක් - ක්ෂේත්‍රයක් වෙන්න එපාය.

ඊළඟට තියෙනවා මෙහෙම එකක්, ඒ සිත හටගන්න කොටම ඒකෙ බලයෙන් ඇතිවෙනවා මතුවෙනවා හෘදය වස්තුරූපය. හෘදය වස්තු රූපය කියන එක අනිවාර්යෙන්ම පහළ වෙනවා. එතකොට ඒ හෘදය වස්තු රූපය තමයි අර හිතට පහළ වෙන්ට ආධාර වෙන්නේ - වස්තුවක් වෙන්නේ - භූමියක් වෙන්නේ. ඒවගේම අර ධර්‍ම ටිකත් මේකට ආධාර වෙනවා - මේ ධර්‍මය අනෙක් එකට ආධාර වෙනවා - ඔය විදියට තමයි ඔය ටික එක රංචු ගැහිලා - පොදි ගැහිලා ඔවුනොවුන්ට භූමියක් වෙලා - රූපය නාමයන්ට භූමියක්වෙනවා (ඔක්කොම නෙමෙයි සමහර ඒවා) නාමය රූපයන්ට භූමියක් වෙනවා. ඔය උපකාරය ලබාගෙන එකට උපදිමින් එකිනෙකාට නිශ්‍රය වෙන නිසා ඒකට කියනවා සහජාත නිශ්‍රය ප්‍රත්‍යය කියල. ඕක චිත්ත - චෛතසික - සහ රූපයන්ගේ වැඩ සටහනක්.

තව එකක් කිව්වා මෙහෙම. ඒකට කියනවා 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' කියල. දැන් ඉස්සෙල්ල කියපු එකෙන් කිව්වේ එකට උපදිමින් අනිත් එක්කෙනාට උපකාරවෙනවා. මේ දැන් කියන්ට යන එකෙන් කියන්නේ කලින් පහළ වෙලා පසුව උපදින්නාවූ එකට උපකාර වෙනවා. ඒකට මෙහෙම කරන්ට පුළුවන්. මම අර කිව්වනේ පැදුරක් වියන කථාවක්. පැදුරක් වියන කොට - ගොක් කොළේකින් හැඩදාල art work එකක් කරනකොට ඒක හදාගෙන යනකොට පින්තූරයයි පැදුරයි දෙකම එකට වියෙනවා. ඒක එකේ සිද්ධ වෙනවා. හැබැයි පින්තූරයක් අඳින කොට මෙහෙම එකක් වෙනවා. පින්තූරයක් අඳින කොට ඉස්සරවෙලා කොළේ එහෙම නැත්නම් කැන්වස් එක හදනවා. ඊට පස්සේ ඒකෙ උඩ පින්තූරේ අඳිනවා. එතකොට එකක් ඉස්සරවෙලා පහළ උනානේ. ඊට පස්සෙනේ පින්තූරෙ හැදෙන්නේ. අන්න ඒ වගේ අවස්ථා තියෙනවා. 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' - ඉස්සරවෙලා හට ගත්තාවූ දෙයක්

ආධාර කරගෙන පස්සේ දෙයක් පහළ වෙනවා. ඉස්සෙල්ල හටගත්ත දේ පස්සේ පහළ වෙන එකට උදව් වෙනවා - උපකාර වෙනවා. ඒකට මෙන්න මෙහෙම එකක් තියෙනවා. දැන් බලන්ට අපි අද මේ බණ අහනවනේ - මේක හිතන්ටකෝ - දැන් බණ අහනවා. දැන් මේ බණ අහන්නේ මොකෙන්ද? කනෙන්. කනෙන්නේ සද්ද ටික අහන්නේ. අපි කියනවා දැන් කන් දෙකෙන් බණ අහනවා කියල. දැන් එතකොට කන් දෙකෙන් බණ අහන්ට - ඊළඟට මම මේ කථාකරන කට - දැන් මේ පින්වතුන්ගේ කන්. ඉස්සර වෙලා කන හිතමු. දැන් මේ පින්වතුන්ගේ කන් - බණ අහන්ට අද පහළ වෙච්ච කනක්ද මේ? නෑ. මේක කලින් පහළ වෙච්ච කනක්. අපි අමතක කරමු ඔය ක්ෂණික සිද්ධ වෙන කථාව. අපි හිතමු දැන් මේ කනට ඉතින් මේ පින්වතුන්ගේ වයසට සති කීපයක් ඇරෙන්න නැත්නම් කනටත් ඒ වයසම තියෙනවනේ. දැන් කෙනෙකුට අවුරුදු 50 ක් නම් ඉතින් 50 න් සති කීපයක් අඩු උනායින් පස්සේ ඉතිරි ටික ඔක්කොම කනේ වයස. ඉතින් දැන් මේ ඉස්සර වෙලා පහළ වෙච්ච කන තමයි අද මේ බණ අහන අවස්ථාවේදී මේ බණ අහන්න උදව් වෙන්නේ. මේ කන පුරේජාතයි. දැන් මේ පුරේජාත වූ කන අද මේ කියලාදෙන බණ - මේ ශබ්ද අහන්ට මේ සිත් පහළ වෙන්ට මේ ඇසීම කරන්ට උදව් වෙනවනේ. ආන්න ඒකට කියනවා 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' කියල. ඉස්සර වෙලා පහළ වෙලා පස්සේ පහළ වෙන්නාවූ දේවල් වලට උදව්වෙන - උපකාරවෙන - භූමියක් වෙන්නාවූ ගතිය ඒකෙ තියෙනවා.

දැන් මේ පැත්ත හිතන්න බලන්න. දැන් මම මේ පින්වතුන්ට අමතනවා. කථා කරනවා. දැන් මේ මම කථාකරන කට මේ බණට පහළ වෙච්ච එකක් නෙමයිනේ. මේක දැන් මම උපන්නාවූ කාලයේ ඉඳලාම පිහිටලා තියෙන්නාවූ 'පුරේජාත' කටක්. ඉතින් ඒ කටින් තමයි දැන් මේ 'පට්ඨාන' කියන ඒවා මේ 'සූත්‍ර' මේ කොටස් කියවෙන්නේ. ඒ නිසා මේ පට්ඨාන කථාව එදා පහළ වෙච්ච එකකුත් නෙමෙයි. මේ පස්සේ තමයි මේ මාතෘකා යටතේ මේ කථාකරන්නේ, මේ සිත් පහළ වෙන්නේ, චෛතසික පහළ වෙන්නේ, මේ ශබ්ද පහළ වෙන්නේ. එතකොට මේ කලින් පහළ වෙච්ච ශරීරය - කට - පසුව පහළකරන්නාවූ ශබ්ද වලට - ඒ වචන වලට - ඒ වචන වලට උදව් වෙලා උපකරවෙලා තියෙනවනේ. ඒකට කියනවා 'පුරේජාත නිශ්‍රය භාවය' 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' කියල. දැන් මේ වචන කථා කරන්ට කට නැත්නම් බැනේ. ඉතින් කට පහළ උනේ කලින්නේ. වචන පස්සෙනේ. ආන්න එතකොට කියනවා - 'පුරේජාත' - කලින් ඉපදිලා පසුව පහළ වෙන ශබ්ද වලට - කලින් ඉපදිලා පසුව පහළ වෙන චිත්ත චෛතසික ධර්මයන්ට උදව්වෙන - උපකාරවෙන - භූමියක් වෙන - පදනම් වන - වස්තුවක් හැටියට තිබෙනවා.

අපි තව එකක් හිතමු මෙහෙම. අපි දැන් සිරීපාදේ යමුකෝ. සිරීපාදේ ගිහිල්ලා දැන් බලනවා. සිරීපාදේ දැන් බොහෝම කල්නේ ඕක පහළ වෙලා. දැන් පස්සේ පස්සේ යන මේ අපේ පරම්පරාවේ අය, අපිටත් පස්සේ අය - දැන්මේ සිරීපාදේ ඉස්සරවෙලා පහළ උනා. ඉතින් අපි විශ්වාස කරනවා බුදුරජාණන්වහන්සේ කල් ඇතුවම වැඩම කරලා සිරිපතුල පිහිටෙව්වා කියල. එතකොට ඒ සිරීපාදය පහළ උනේ කලියෙන්. ඊළඟට පසුව පසුව යන්නාවූ අයට මේ සිරීපාදය - කලින් පහළවෙලා තිබෙන සිරීපාදය උදව් වෙනවනේ - උපකාර වෙනවානේ - බලන්ට - දකින්ට. ඒකට කියන්නේ 'පුරේජාත උපනිශ්‍රය ප්‍රත්‍යය' කියල.

ඒක හැබැයි තව ටිකක් සියුම් වෙන්න ඕනේ. මේකේ තියෙනවා පොඩි - තව ටිකක් සියුම් වීමක් - ඕලාරික මට්ටමකින් කිව්වේ. මේක තව ටිකක් පොඩියට පොඩියට පොඩිකරගෙන ගියැන් පස්සේ මේකේ තියෙනවා අමුතු ගතියක්.

චිත්ත චෛතසික ධර්ම කියල කියන්නේ හරිම සියුම් වෙච්ච මහා පුදුමාකාර සියුම් ස්වභාවයකින් තියෙන ඉරක් ඇඳලා පෙන්නන්න බැරි නමුත්, හොඳට අමු අමුවේම තිබෙන්නාවූ පුදුම ශක්ති ටිකක් මේ. මේ චිත්ත චෛතසික කියන ධර්ම. මේ චිත්ත චෛතසික ධර්ම - මේ ශක්ති ටිකට තව ශක්තියකට - තවත් දේකට පුදුම උදව්වෙන - උපකාරවෙන - භූමියක් වෙන ගතියක් තියෙනවනේ. නිශ්‍රය වෙන ගතියක් තියෙනවනේ. පදනම් වෙන මොකක් හරි ගතියක් ඒකෙ තියෙනවා. හැබැයි පෙන්නන්න බෑ - ඒකෙ එහෙම්ම තියෙනවා. මේකේ තව එකක් තියෙනවා. සහජාත ප්‍රත්‍යය සහ පුරේජාත ප්‍රත්‍යයයේ වස්තුව ගැන බැලුවයින් පස්සේ දැන් ඇස කන නාසය දිව ශරීරය ඊළඟට හෘදය වස්තු රූපය - මේවා කලින් පහළ වෙලා පසුව පසුව පහළ වෙන චිත්ත චෛතසික නාම ධර්මයන්ට උදව් වෙනවනේ. උපකාර වෙනවනේ.

දැන් මේ ටික මේ විදියට ඔහොම තිබ්බ්වාවේ. මේ ටික ඔහොම තියලා දැන් මෙච්චර වෙලා කථාකරා මම - මම එක මාතෘකාවක් යටතේ කරුණු දෙකක් ප්‍රධාන වශයෙන් කිව්වා. එකක් තමයි ‘සහජාත නිශ්‍රය ප්‍රත්‍යය’ – ‘පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය’ කියන එකේ වෙනස කියල දුන්නා.

තව එකක් අපි හිතන්ට ඕනෑ. වෙන පැත්තකට යමු. ඒ තමයි අපේ ජීවිතියේ තියෙනවා කිව්වා ආකාර 4 ක රූප ධර්ම පහළ වෙලා. ඒ තමයි කර්මජ රූප - චිත්තජ රූප - ඍතුජ රූප - අහාරජ රූප. මේකෙන් කර්මජ රූප වලට විශේෂ තැනක් හිමි වෙනවා. කර්මජ රූප හැදෙන්නේ මේ විදයටයි. හෘදය වස්තු රූපය කර්මජ රූපයක්. ඇස කර්මජ රූපයක්. කන කර්මජ රූපයක්. නාසය - දිව කර්මජ රූප. කය කර්මජ රූප. මේවා කර්මයෙන් හට ගත්ත ඒවා - අපි අමුතු කෑමක් කාපු නිසා පහළ වෙච්ච ඒවා නෙමෙයි. එහෙම නැත්නම් අමුතු ඉරියව්වක ඉඳගෙන හිටපු නිසා පහළ වෙච්ච ඒවා නෙමෙයි. අමුතු විදියට හිත හිතා හිටපු නිසා පහළ වෙච්ච ඒවා නෙමෙයි. මේවා කර්ම ශක්තියකින් පහළ වෙච්ච ඇස කන නාසය දිව ශරීරය හෘදය වස්තුව අනිත් එක තමයි භාව රූප. ඕව කර්මයෙන් පහළ වෙලා තියෙන්නේ.

දැන් මේ කර්මයෙන් පහළ වෙලා තියෙන ඒවාගේ තියෙනවා ඒවාට ආවේනික වෙච්ච අමුතු කාලයක් තියෙනවා. පහළ වෙලා ඉන්න පුළුවන් කාලයක් තියෙනවා. ඒ පහළ වෙලා ඉන්න පුළුවන් කාලය චිතක්ෂණ 17 ක් - ඒකියන්නේ හිත පහළ වෙනවා වගේ 17 ක් වතාවක කාලයක් මේ රූපයකට ඉන්න පුළුවන්. හිතට එච්චර ඉන්න බෑ. හිත පහළ උනා - මැරී වැටුන, පහළ උනා - මැරී වැටුන. එහෙම ගතියක් ඒකෙ තියෙන්නේ. දැන් සිත් පහළ වෙලා 17 වතාවක් මැරී යනවා 17 වතාවක් උපදිනවා - ඒකාලය එක වතාවක් ඉපදිලා චිතක්ෂණ 17 කට සමාන කාලයක් ඉන්ට පුළුවන් මේ රූපවලට (ඔක්කොටම නෙමෙයි සමහර ඒවාට). ඉතින් දැන් මේකේ තිබෙනවා - සිතක් පහළ වෙනකොට ඒ සිතත් එක්ක කර්මජ රූපත් පහළ වෙනවා. මේ කථාව පොඩ්ඩක් පටලවාගන්නේ නැතුව අහගෙන ඉන්න. ප්‍රතිසන්ධි අවස්ථාවේදීත් කර්මජ රූප පහළ වෙනවා. ඊළඟට භවාංග අවස්ථාවේදීත් කර්මජ රූප පහළ

වෙනවා. පස්සේ පස්සේ භවාංග අවස්ථාවලදීත් කර්මජ රූප පහළ වෙනවා. හැම සිතක් සිතක් ගානේ කර්මජ රූප පහළ වෙනවා.මේ කර්මජ රූප පහළ වීම් පටන්ගන්නේ ප්‍රතිසන්ධි අවස්ථාවේ ඉඳල. ප්‍රතිසන්ධි හිත විපාකයක්, ඒකෙන් පටන් ගන්නවා කර්මජ රූප හදන්න. භවාංග සිත් කියල කියන්නේ විපාක සිතක්. ඒකෙන් පටන් ගන්නවා කර්මජ රූප හදන්න - දිගට කරගෙන යනවා. දිගට කරගෙන කරගෙන ගිහිල්ලා - ඒ අතරේ භවාංග විතරක් නෙමෙයිනේ අපි තියාගෙන ඉන්නේ - අපේ මේ බලන හිත් - අහන හිත් - චිත්ත වීථි - ඕවත් පහළ වෙනවනේ. ඔය චිත්ත වීථි යන අවස්ථාවේදීත් ඒ ඒ සිත් අවස්ථාවලදීත් කර්මජ රූප පහළ වෙනවා. අපි හිතමු චිත්ත වීථියක් යනවා කියල. චිත්ත වීථියකට අපි කියල දුන්න සිත් 17 ක් තියෙනවා කියල. ඒක පටන් ගන්නේ කොහොමද? අපි සලකමු මෙහෙම. පංචද්වාරාවජ්ජන චිත්ත වීථියක් කියල හිතමු අපි මේ බණ ඇසීම සඳහා ගන්න.

භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාරාවජ්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - ජවන් - ජවන් - ජවන්- ජවන් - ජවන් - ජවන් - ජවන් - තදාරම්මණ - තදරම්මණ. දැන් සිත් පේළිය 17 නෙ. මේ සිත් පේළියේ - 17 හේ - හැම සිතක් ගානෙම කර්මජ රූපත් පහළ වෙනවා. භවාංග සිත්ගාවදී කර්මජ රූප පහළ වෙනවා - භවාංග චලන අවස්ථාවේදී කර්මජ රූප පහළ වෙනවා - භවාංග උපච්ඡේද අවස්ථාවේ කර්මජ රූප පහළ වෙනවා - පංචද්වාරාවජ්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන යන හැම අවස්ථාවකදීම නවතින්නේ නැතුව මේකේ පහළ වෙනවා දිගටම. කර්මජ රූප දිගට දිගට දිගට පහළ වෙනවා. හැබැයි කලින්- චිතක්ෂණ 17 කට කලින් පහළ වෙච්ච රූප ටිකක් දැන් මැරීගෙන මැරීගෙන යනවා. මැරීගෙන යන ගමන් අලුතින් අලුතින් පහළ වෙන ඒ ඒ සිත් වලට සමානව කර්මජ රූපත් පහළ වෙනවා.

දැන් චිත්ත වීථියක භවාංග අවස්ථාවේ එනම් පළවෙනි සිතනේ - එතනට එනකොට සමහර කර්මජ රූප මැරෙනවා. සමහර ඒවගේ ආයුෂ මැද. සමහර ඒවා ඒකත් එක්ක උපදිනවා. භවාංග චලන අවස්ථාවේදී සමහර රූප කර්මජ රූප මැරෙනවා. සමහර ඒවගේ ආයුෂ මැද. සමහර ඒවා ඒවෙලාවේ උපදිනවා. භවාංග උපච්ඡේදයේත් එහෙමයි. පංචද්වාරාවජ්ජනයෙත් එහෙමයි. ඒක නිසා ඔය හැම හිතක් ගාවම කර්මජ රූපයක් පහළ වෙනවා - සමහර ඒවා මැරිලා යනවා - හරියට මේ අපේ පරම්පරා වගේ. අපි බැලුවම දැන් මේ කාලේ අපේ ඉස්සල්ල ආපු කට්ටිය මැරීගෙන යනවා - ආච්චිලා සීයල - ඒහොල්ල මැරීගෙන යනවා. ඒවාගේම ඒගොල්ල මැරීගෙන යනකොට අපේ පරම්පරාවේ තව ටිකක් ඔන්න උපදිනවා. ඉස්සෙල්ල ටිකක් මැරෙනවා. ඊළඟට දැනට ඉපදිලා ඉන්න ටිකක් මැදි වයසේ ඉන්නවා. සමහරුන්ගේ වයස අවුරුද්දයි දෙකයි තුනයි වැඩීගෙන යනවා. සමහරු මරණයට කිට්ටු වෙලා ඉන්නවා. ඒවගේම සමහරු මැදි වයසේ. ඔය විදියට වයසත් ප්‍රභේද වෙනවනේ. ඒක නිසා අපිට මේ පරම්පරාව කියල කිව්වට අපිට මේ අඩුවක් එහෙම දැනෙන එකකුත් නෑ. මැරෙන්න මැරෙන්න අඩුවක් දැනෙන්නේ නැත්තේ දැන් මැරෙන්නේ ඉස්සෙල්ලාම ඉපදිච්ච කට්ටියනේ. ඊට මෙහා ඉපදිච්ච කට්ටිය ටිකක් ඉන්නවනේ. ඊළඟට අද උපදින කට්ටියකුත් ඉන්නවනේ. ඒක නිසා දැන් මේක මෙහෙම වෙන නිසා අඩුවක් පෙන්නේ නෑ. ඔය කර්මජ රූපත් ඔන්න ඔය වගේ. අපේ ඇහැ ගත්තම කන නාසය ගත්තයින් පස්සේ ඊයේ තිබ්ච්ච

කර්මජ රූප අද නෑ. අදට තියෙන්නේ කර්මජ රූප අද පහළවෙන ඒවා. දැන් අඩුවක් පෙන්නේ නෑ. ඇතිවෙනවා නැතිවෙනවා හැබැයි චිතක්ෂණ 17 ක් තිබිල නැතිවෙලා යනවා. ඔන්න ඔය වගේ වැඩ සටහනක් සිද්ධ වෙනවා. දැන් මේක මම මේ විදියට කිව්වා.

තව අපි පොඩ්ඩක් එක පැත්තකට යමු. ඒ තමයි මේ හෘදය වස්තු රූපය කියන තැන. පැටලැවෙන තැන. හෘදය වස්තු රූපය කියන තැන පැටලැවෙන තැනක්. ඒක, අපි කථාකරන හෘදය වස්තුවයි ඊළඟට දැන් මේ තැන් තැන් වල කථා කරන හෘදය වස්තුවයි - අපි බලමු මෙහෙම. දැන් අපිට පොඩිකාලේ ඔය හෘදය වස්තුව කියන එක ඉගැන්නුවා. රතුපාට බෝලයක් ඒවාගේම නිකං අඹ ගෙඩියක් වගේ - නහර වැල් ටිකක් උඩටයි පහළටයි දාල රතු පාට - ඉතින් පින්තූර ගෙනල්ලත් පෙන්නුවා ඉස්සෙල්ලාම හුණු කැල්ලකින් තමයි ඇඳල පෙන්නුවේ මෙහෙමයි ළමයිනේ හෘදය වස්තුව කියල. ඉතින් ඒ ඉස්සර වෙලාම හෘදය වස්තුව කියන එක අහපු තැන. ඒ කාලේ ඉතින් අපේ ජීවිතේ පටන් ගත්තේ පට්ඨානයත් එක්ක නෙමෙයිනේ. ඉතින් මේවා පින්තූර ගතකරලා ලියල ලියල දැන් හොඳටම අපිට හෘදය වස්තුව කියන එක ඇහෙන කොටම අර අඹ ගෙඩියක් වගේ තිබෙන ඔය පින්තූරේ තමයි ඉස්සරවෙලාම අර පෙරහැරේ කස කාරයෝ යන්න වගේ - ඉස්සෙල්ලාමනේ යන්නේ ඒ ගොල්ලෝ - ඒවගේ ඉස්සරවෙලාම එන පින්තූරේ තමයි ඕක - මේ හෘදය වස්තුව. දැන් ඊට පස්සේ මේ හදවත ගැන වෙනම වෛද්‍ය වරු ඉන්නවා. වෙන ලෙඩ තියෙනවා. එතෙන්ටම අවේනික එතෙන්ටම ගැවසෙන ලෙඩ රෝග නිසා හදවතටම වෙන් වෙච්ච ලෙඩ මාතෘකාව තියෙනවා. හදවතටම වෙන් වෙච්ච වෙනමම වචන set එකක් තියෙනවා වෛද්‍ය විද්‍යාවේ. ඊළඟට එතෙන්ට පාවිච්චි කරන වෙනමම තියෙනවා surgeries වල tools අරවාමෙවා. එතෙන්ටම හදන වෙනම බෙහෙත් ජාති තියෙනවා. දැන් බලන්ට ඒක එහෙමනේ. හැබැයි ඔය පින්තූරේ දාගෙන - ඔය හදවත - ඔය ඉස්කෝලේ කියලදීපු - අර රූප වලින් දාගෙන හදපු හෘදය වස්තුව අපේ ඔළුවේ ඇඳගෙන අපි මේ අද කථාකරන මේ බණට බහිනවා නේද අපි ඔක්කෝම නිකාම්ම නිකං වතුරේ ගහගෙන යනව වගේ නිකං අසරණ වෙලා ගහගෙන යනවා. තේරුම් ගන්ට බැරිවෙනවා. මේ හෘදය වස්තු රූපය කියන එක ඔය වගේ ලොකු අලගෙඩියක් වගේ එකක් නෙමෙයි. ඒක බොහොම පුංචි උපාදාය රූපයක්. ඒක ඇවිල්ල රූපමය ගුණ විශේෂයක්. ඉස්සරවෙලාම පහළවෙන ඔය අඹ ගෙඩියක් වගේ රවුමක් නෙමෙයි. එක්තරා විදියක රූපමය ගතියක්.

උදාහරණයක් කියන්නම් මෙන්න මෙහෙම - අර තියෙනව නේද අපි ගලක් මැද්දම - කළු ගලක් මැද්දම - මැදල මැදල මැදල වතුර දාල දාල දාල මැදල ගොඩක් සියුම් වෙන්න මැද්දට පස්සේ මතුවෙනවා නේද shiny ගතියක්. ඒ shiny ගතිය අර ගලේ තිබ්ච්ච එකක්ද නැති එකක්ද? ඕක තිබ්ච්ච එකක්. තිබුනේ නැත්නම් ඕක එන්නේ නෑනේ. දැන් ඔය shiny ගතිය වෙන ගලකින් ගෙනැල්ල ඕකට දාපු එහෙකුත් නෙමෙයි. අලවපු එහෙකුත් නෙමෙයි. ඕක ඕකේ තිබ්ච්ච එකක්. තිබ්ච්ච එකක් එක්තරා ක්‍රමයකට මතුකරලා ගත්ත එකක් තියෙන්නේ. ඒක නිසා shiny ගතිය ඕකේ තියෙනවා. හැබැයි shiny ගතියට අර කළුගල නැතුව ඉන්න බෑ. ඒ shiny ගතිය එකක් - ඒ shiny ගතිය - ඒ smooth ගතිය පිහිටලා තියෙන්න ආධාර වෙලා හේත්තුවෙලා තියෙන්ට මොකක් හරි දෙයක් තියෙන්ට එපැයි - ඒ

කළුගල. දැන් ඒ වගේ, අපේ ඉස්සරවෙලාම ලොකු හදවතක් නෙමෙයි පහළ වෙන්නේ. රූපමය ගුණයක් පහළ වෙන්නේ. හිත ආධාර කරගෙන රූපමය ගුණයක් පහළ වෙන්නේ. ඒකට කියනවා -ඉස්සරවෙලාම පහළ වෙන්නාවූ ඒ ඔප ගතියට කියනවා 'හෘදය වස්තු රූපය' කියල. දැන් ඔය shiny ගතිය මතු උනාට පස්සෙනේ අපේ මූණ පේන්නේ ඒකෙ. දැන් අපිට මූණ පේන්නේ නැනේ ඉස්සර වෙලා. කළුගල දිහා බලපු ගමන් මූණ පේන්නේ නැනේ. ඒකෙ shiny ගතිය මතුකරලා ආවයින් පස්සෙනේ හොඳට පේන්නේ. අපේ reflection එක වැටනෙවනේ. ඒකෙ මහා අමුතුම රූපමය ගුණ ස්වභාවයක් තියෙනවා ඔය රූප 28 ඇතුලේ. ඕකේ එක රූපයක් තමයි හෘදය වස්තු රූපය කියල කියන්නේ. හැබැයි ඒක අපිට හදන්න බෑ. විද්‍යාඥයන්ට හදන්ට බෑ. ඒක වෙන්නේ නෑ. ඒක කරන්ට බෑ. ඒකට ඒ හෘදයවස්තු කියන ඒ රූපමය energy එක - රූපමය ගතිය මතුවෙන කර්ම energy එකක් තියෙන්ට ඕනෑ. ඒක අවොත් තමයි මේක කරන්ට පුළුවන් කම තියෙන්නේ. මේක හැදෙන්නේ නැතුව හැදෙන්නේ නෑ. ඒක නිසා මේ හෘදය වස්තු රූපය කියන එක බොහොම සියුම් වූ - බොහෝම සියුම් වූ ඒ රූපමය ගුණ ස්වභාවය ප්‍රතිසන්ධි හිතේ කර්මයෙන්ම හැදිච්ච එකක්. ඒ හෘදය වස්තු රූපය අපි හිතමු ප්‍රතිසන්ධි හිතත් එක්ක හැදුන නැතිඋනා කියල හැබැයි ඒක සම්පූර්ණ නැතිවෙන්නේ නෑ පරම්පරාව ගෙනියනවා. ඒක අධාරකරගෙන තමයි අර පස්සේ පහළවෙන සිත්වලින් ගොඩ හරියක් පහළ වෙන්නේ. දැන් අපි කියනවා චක්ඛු සෝත ඝාණ ජිව්හා ඒවා ඇවිල්ල ආයතන වශයෙන් පහළ වෙන සිත් හැබැයි ඊට වඩා හෘදය වස්තු රූපය ආධාර කරගෙන කෝටි ප්‍රකෝටි ගානක් පහළ වෙනවා. හරී වැඩියි. හරිම වැඩියි වස්තු රූපය අධාර කරගෙන පහළ වෙන සිත්. ඒක නිසා මේ හිත පහළ වෙන්ට මොකක්ද ආධාර වෙන්ට ඕනෑ වෙන්නෙ - නිශ්‍රය වෙන්ට ඕනෑ වෙන්නේ? රූපයක් එපැය. ඒ රූපය තමයි අර සියුම් වූ හෘදය වස්තු රූපය කියල කියන්නේ.

එතකොට මම හිතනවා දැන් අපි ගොඩක් කියාගෙන ගියා. මේ වෙනකොට මම කියල දුන්න නිශ්‍රය ප්‍රත්‍යය යටතේ 'සහජාත නිශ්‍රය ගුණ ස්වභාවය' එහෙම නැත්නම් 'සහජාත නිශ්‍රය ප්‍රත්‍යය'. ඊළඟට 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'. තව ගොඩක් තියෙනවා. ඒක කියන්න මාර්ගය සකසා ගැනීම වශයෙන් තමයි මම රූප පහළ වීම පිළිබඳව මතක් කරේ සහ කර්මජ රූප හටගැනීමේදී සෑම චිත්තක්ෂණයකදීම රූප පහළ වෙනවා - ඒකට හෘදය වස්තු රූපය කියල කියන්නේ ඇයි - ඒවගේම අපි හිතන හෘදය වස්තු රූපමයද ඒ හැඩේද තියෙන්නේ කියන එක මතක් කරේ. හෘදය වස්තු රූපය කියල කියන්නේ අමුතුම විදියේ සියුම් වූ හිතට ඉන්න පුළුවන් අවේනික රූපමය ගුණ ස්වාභයක්. ඊට වඩා දෙයක් නෑ. අපි මේ කපන heart එක අයින් කරන heart එක නෙමෙයි. මේක රූපයේ ප්‍රධාන ස්වරූපය. - 'රූපවල heart එක'.

අපි ඔය විදියට දැන් මේ ටික මෙතනින් තේරුම් අරගෙන අවස්ථානුකූලව නවත්වමු. ඉතින් දැන් වෙලාවත් කලාවත් තරමකට ගිහිල්ලා තියෙන නිසා මම මේ වෙලාවේ කැමතියි පින්වතුන්ට ආශීර්වාද කරලා නවතින්ට. හේතුව මේක ගොඩාක් කියාගෙන යන්න ඕනෑ ප්‍රශ්න ටිකකුත් තව එක්කාසු කරගෙන. මට ප්‍රශ්නයකුත් යොදල තිබුන ඒකටත් හොඳ උත්තරයක් දෙන්ට ඕන. ඒකත් හිතිය යුතු දෙයක් තමයි. ධර්මයෙ නම් ඕකට උත්තරයක් තියෙනවා. ඒකටත් ගොඩක් කල් යනවා. ඒකට ආධාර වෙච්ච දේකුත් මේ අද කියපු ටිකකින් එක්කාසු කරගන්න පුළුවන් වෙන්ට ඇතියි කියල හිතනවා. අද මේ කියල දීපු ටික මේ

පින්වතුන් නැවත නැවත සාකච්ඡා කරන්ට හිතන්ට අහන්න. ප්‍රශ්න තියෙනව නම් ඒවත් එක්කාසු කරගෙන නැවත ඉදිරිපත් කරන්න.

හෙට උදේ පාන්දර අපේ භාවනා වැඩසටහනක් ආරම්භ කරනවා. ඒ භාවනාවට යන්න ඕනෑ. ඒකනිසා අද අපේ වේලාව රාත්‍රී එකොළහමාරට කිට්ටුයි දැන්. ඉතින් ඒකනිසා මම මේ වෙලාවේ මේ පින්වතුන්ට මෙතකින් මේ ධර්ම විග්‍රහය අවසන් කරලා ආශීර්වාද කරලා සෙත් පතල මම මෙතනින් නවතිනවා.

ඉතින් අද මේ කථා කරපු ධර්මය හරි ගාම්භීරයි. මේ තිබෙන්නාවූ ස්වරූප ලක්ෂණ ගුණ ස්වභාවයන් තව තව ඉදිරියේදී සාකච්ඡා කරලා තේරුම් ගන්න පුළුවන් වෙයි. ඒ සඳහා හැම දෙනාටම රත්නත්‍රයේ ආශීර්වාදය නොඅඩුව සැලසේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. නිදුක් භාවය නිරෝගී භාවය සැලසේවා! ධර්ම අවබෝධය සැමදෙනාටම සුවසේ සිද්ධ වේවා! මේ වගේ ගැඹුරු සාකච්ඡාවල් ලෝකේ වටේ පිරිසක් එක්කාසු කරගෙන මේ සිද්ධ කරන්නේ පිංවත් ලලිත් දළුවත්ත මහත්මයා ආරම්භ කරපු දහම් වැඩ සටහන නිසා. හොඳ කල්‍යාණ මිත්‍රත්වයක් කියල සැමදෙනාටම සතුටු වෙන්න පුළුවන්. එතුමා නිසා තමයි මේ අපි දකින්නේ නැතුව - මේ මූණු වලින් ශරීර වලින් පේන්නේ නැතුව හඬක් හරහා සිත් එක්කාසු කරගෙන මේ වැඩේ ගෙනියන්නේ. ඉතින් මේක බැලුවයින් පස්සේ එක විදියකට කියනවානම් දීර්ඝායුෂ තිබෙන ලොව්තුරා බුදුරජාණන්වහන්සේලාගේ කාලවල උන්වහන්සේලා මේ බණ දේශනා කරන්නේ නෑ කියනවනේ. බණ දේශනා කරන්නේ නැතිලු. කෙටි ආයුෂ තිබෙන බුදුරජාණන්වහන්සේලා බණ දේශනා කරනවලු. අනිත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේලා එනම් දීර්ඝායුෂ බුදුවරුන්ගේ සාසන වල නිතර බණ කියන්නෙත් නැතිලු. දවස් 15 කට එකයි. ඒත් හිතින් හිතට බණ කියන්නේ. ශ්‍රාවකයෝ ඔක්කොම වාඩිවෙලා ඉන්නවලු ලොව්තුරා බුදුරජාණන්වහන්සේ හිතින් හිතට අමතනවා. බුදුරජාණන්වහන්සේ පේන්නෙත් නෑ නමුත් ශ්‍රාවකයෝ උන්වහන්සේගේ හිත හිතින් හිත අමතනවා. ඒවගේම නොවුනත් - අපි කවුරුවත් දන්නේ නෑ. සමහරු මම දැකල නෑ. මම දැකල නෑ අනිත් අය. නමුත් මේ හඬක් හරහා අපි හිත් වලට අමතනවා. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ දහම් පණිවිඩය සරහාර තැන් ගැඹුරු තැන් අරගෙන යනවා. ඒ සඳහා මේ මාධ්‍ය මේ පාර හදාගෙන තියාගත්තේ අපේ දළුවත්ත මහත්තයා. ඒ නිසා එතුමාට නිරෝගී සැප දීර්ඝායුෂ වේවා! එතුමාගේ අතීත අකුසල කර්ම බලවේග යටපත්වෙලා ප්‍රතිභාහනය කරගෙන හොඳ සැපවත් ධර්මානුකූල ජීවිතයක් ඉදිරියට ගෙනයන්න ලැබේවා! ඒ පිංවත් පවුලේ සැමදෙනාටමත් අද මේ ධර්මය අසාගෙන හිතාගෙන මෙනෙහි කරමින් සිටියාවූ සියලු දෙනාටමත් ඒකාන්තයෙන්ම මේ උතුම් ධර්මය නිර්වාණ අවබෝධයට මාර්ගයක් පිහිටක් වේවා! සැමදෙනාටම කෙලවර නිවන් අවබෝධ වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම මේ උතුම් ධර්මය නිවන් පිණිස වේවා! සැමදෙනාගේම සිත් මේ ධර්මයත් අහගෙන - ඒ කියපු සියුම් වූ - සූක්ෂ්ම වූ ගුණ ස්වභාව ලක්ෂණ - ධර්ම ස්වභාව ඇඟිඳගෙන - ඒවායේ තිබෙන ගුණ ස්වභාව - හයිය නැති ගතිය - කඩා හැලෙන ගතිය - බිඳ වැටෙන ගතිය තේරුම් අරගෙන ඒ වගේම බිඳ වැටෙන්නේ නැති සදාකාලික ගුණ ස්වභාවයක් වෙන නිර්වාණ ධාතුව සැමදෙනාටම සුවසේ අවබෝධ වෙමින් නිවනින්ම සිත් නිවියේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.